# ඌව පළාත් සභාව - 2019

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 24 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්න්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ඌව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය අදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්ව ඇත.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් සිදුකරන ලද පහත දැක්වෙන නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේදයට යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.1(අ) | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය සතු පුස්තකාල පොත්වල වටිනාකම හඳුනාගෙන 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | පුස්තකාල පොත්වල වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතුය. |
| 1.6.1 (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ආයතන 03 ක් විසින් සකස් කරන ලද වාණිජ අත්තිකාරම් ගිණුම්වල ගෙවිය යුතු අත්තිකාරම් ශේෂ දක්වා | ආයතනය විසින් ඉදිරිපත් කරන ගිණුම් තොරතුරු ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සමඟ සමාන විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නොතිබුණු අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව පියවිය යුතු අත්තිකාරම් ශේෂය රු. 4,777,252 ක් විය. | |
| | 1.6.1 (ඌ) | වර්ෂ 10 කට අධික කාලයක් පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන වල වත්කම් වශයෙන් දක්වා තිබුණු රු. 40,326,651 ක ණය මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ද අයකර නොතිබුණි. | අදාල නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1990 අංක 08 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ X වන පරිච්ඡේදය ප්‍රකාරව අයකරනු ලබන මුද්දර ගාස්තු, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2)(ආ), නගර සභා ආඥා පනතේ 158 (2)(ආ) සහ මහා නගර සභා ආඥා පනතේ 185 (2)(ඇ) ප්‍රකාරව අදාල පළාත් පාලන ආයතනයේ අරමුදලට බැරවිය යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ඌව පළාත් සභාව විසින් රැස්කරන ලද රු. 331,997,565 ක් වූ මුද්දර ගාස්තු අදාල පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය කරන තෙක් බැරකමක් ලෙස හඳුනා නොගෙන පළාත් සභාවේ ආදායමක් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි. | පළාත් සභාවේ බැරකමක් ලෙස හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. | අයකරනු ලබන මුද්දර ගාස්තුව නැවත පළාත් පාලන ආයතන වෙත ගෙවීම සඳහා පවතින බැරකම නෛතික අසම්භාව්‍ය බැරකමක ස්වරූපයක් ගන්නා අතර, එය නිරවුල් කිරීමට සිදු වුවහොත් 1993 අංක 05 දරන මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය ප්‍රකාරව නැවත ගෙවීම සඳහා වාර්ෂික මුදල් ප්‍රඥප්තියෙන් වැය විෂය අංක 1504 යටතේ ප්‍රතිපාදන සලසා ඇත. |
| (ආ) | ඌව පළාත් සභාවට එරෙහිව පවරා ඇති නඩු කටයුතු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. | පළාත් සභා අරමුදලින් නිශ්චිතව ගෙවිය යුතු අසම්භාව්‍ය බැරකම් හඳුනා ගැනීමක් සිදු නොවූ හෙයින් පළාත් සභා අරමුදලේ හෙළිදරව් කර නැත. ඉදිරියේදී එවැනි නිශ්චිතතාවයන් සනාථ කිරීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව සංවර්ධන වැය රු. 1,130,191,685 ක් වුවද, විස්තරාත්මක උපලේඛන අනුව එය රු. 1,123,153,786 ක් වූයෙන් රු. 7,037,899 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් තොරතුරු ඊට අදාල උපලේඛන සමඟ සැසඳිය යුතුය. | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය නිවැරදි වන අතර එම ශේෂය තුල මූල්‍ය කල්බදු වාරිකය ඇතුලත් වීම මෙම වෙනසට හේතු වේ. |
| (ඈ) | පළාත් සභා ආදායම් ගිණුම අනුව බදු හා බදු නොවන ආදායම රු. 3,666,120,917 ක් වුවද පළාත් සභා මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කාර්ය සාධන ප්‍රකාශනය අනුව එය රු. 3,677,321,463 ක් වූයෙන් රු. 11,200,546 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඒකාබද්ධ ආදායම් ගිණුමේ දැක්වෙන තොරතුරු ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳිය යුතුය. | හිඟ ආදායම් රැස් කිරීම් ගිණුම්ගත කිරීම අනුව ඒකාබද්ධ ආදායම් ගිණුම හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අතර වෙනසක් පවතී. |

1.7 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

-----------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහය | | | |
| (i) | මුදල් රීති 104.2 | 2019 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුල බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 08 කට සිදුවූ අනතුරු සම්බන්ධ අලාභ හානි පිළිබඳව විගණකාධිපති වරයාට වාර්තා කර නොතිබුණි. | ඌව පළාත් සභා මුදල් රීති 104.2 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඒ ඒ වර්ෂ වලට අදාල විසර්ජන ගිණුම් මගින් වාර්තා කර ඇත. |
| (ii) | මුදල් රීති 104.4 | බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 11 ක අනතුරු සම්බන්ධ පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීම මාස 03 සිට අවුරුදු 1 ½ ක කාල පරාසයක් දක්වා ප්‍රමාද වී තිබුණි. | ඌව පළාත් සභා මුදල් රීති 104.4 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අනතුරට අදාලව පොලිස් වාර්තා ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම, මූලික විමර්ෂන කටයුතු, ප්‍රසම්පාදන කටයුතු, උසාවි නඩු කටයුතු, රක්ෂණාවරණ හා ඇස්තමේන්තු අනුමැතිය සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | 2019 ඔක්තෝබර් 28 දිනැති අංක 30/2019 දරන චක්‍රලේඛය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය විසින් නැවත සේවයේ යොදවන ලද විශ්‍රාමික නිලධාරීන් | 2019 ඔක්තෝබර් 28 දිනැති අංක 03/2019 දරන | තොරතුරු ඉදිරිපත් කරන ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම් |

| | | | | |
|---|---|---|---|---|
| | | 64 දෙනෙකු පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වරුන්ට හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ට දන්වා ඇත. |
| (ඇ) | ජනාධිපති ලේකම් චක්‍රලේඛ<br>---------------------------- | | | |
| (i) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ජී/11-18 දරන චක්‍රලේඛයේ 7.4 ජේදය | පළාත් ප්‍රධාන අමාත්‍ය, පළාත් අමාත්‍ය, පළාත් සභා සභාපති , පළාත් සභා නියෝජ්‍ය සභාපති යන ධූරධාරීන්ට එම තනතුරට හිමි දීමනා පමණක් හිමිවිය යුතු අතර මන්ත්‍රීවරයකු වශයෙන් ලබාගත හැකි දීමනා නොගෙවිය යුතුය. එහෙත් සභා ලේකම් කාර්යාලය විසින් 2018 නොවැම්බර් මස සිට 2019 සැප්තැම්බර් මස දක්වා මන්ත්‍රීවරයෙකු වශයෙන් ලබාගත හැකි දීමනා රු. 12,616,362 ක් එම ධූරධාරීන් වෙත ගෙවා තිබුණි. | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ජී/11-18 දරන චක්‍රලේඛයේ 7.4 ජේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අමාත්‍ය මණ්ඩල තීරණ හා ප්‍රධාන ලේකම් විසින් ලබාදුන් උපදෙස් මත සියලු ගෙවීම් කටයුතු සිදු කර ඇත. |
| (ii) | 1993 දෙසැම්බර් 31 දිනැති අංක PPA/61/1 දරන චක්‍රලේඛය | විදේශ නිල චාරිකා සඳහා සහභාගිවන නිලධාරීන් 5 දෙනෙකු විසින් නිල චාරිකාව නිමකර ආපසු පැමිණි පසු දින 07 ක් තුල ඉදිරිපත් කළයුතු වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 1993 දෙසැම්බර් 31 දිනැති අංක PPA/61/1 හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වාර්තා මෙතෙක් ඉදිරිපත් නොකළ නිලධාරීන්ට අදාල වාර්තා ලබාදෙන ලෙස දන්වා ඇත. |

2. ආදායම් කළමනාකරණය
---------------------------

| විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>----------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම<br>-------------------- |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ආදායම් විෂයයන් 05 ක හිඟ ආදායම් එකතුව රු. 201,246,725 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර අයකර ගැනීම ගැටළු සහගත හිඟ ආදායම් කපා හැරීම සඳහා උපදෙස් ලබා දී ඇත. |

3. මූල්‍ය සමාලෝචනය
---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 3,320,573,725 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,281,879,774 ක් විය.

3.2 ආදායම හා වියදම
-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ආදායම | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2019 | | | 2018 | | |
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම්** | | | | | | |
| බදු ආදායම | 4,877,230,000 | 3,199,744,392 | (1,677,485,608) | 3,711,650,000 | 3,137,004,798 | (574,645,202) |
| බදු නොවන ආදායම | 477,705,000 | 477,577,071 | (127,929) | 608,350,000 | 570,836,175 | (37,513,825) |
| රජයේ ප්‍රදාන | 23,138,000,000 | 21,249,500,000 | (1,888,500,000) | 19,566,798,000 | 19,053,001,000 | (513,797,000) |
| එකතුව | 28,492,935,000 | 24,926,821,463 | (3,566,113,537) | 23,886,798,000 | 22,760,841,973 | (1,125,956,027) |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 19,248,388,223 | 19,129,812,766 | 118,575,457 | 490,691,000 | 399,828,138 | 90,862,862 |
| අනෙකුත් පුනරාවර්තන | 4,480,933,777 | 5,036,621,893 | (555,688,116) | 19,540,710,000 | 19,907,077,670 | (366,367,670) |
| උප එකතුව | 23,729,322,000 | 24,166,434,659 | (437,112,659) | 20,031,401,000 | 20,306,905,808 | (275,504,808) |
| රාජ්‍ය ආයෝජන | 4,472,728,157 | 967,863,593 | 3,504,864,564 | 3,855,379,000 | 2,937,300,565 | 918,078,435 |
| එකතුව | 28,202,050,157 | 25,134,298,252 | 3,067,751,905 | 23,886,780,000 | 23,244,206,373 | 642,573,627 |

වර්ෂයේ මුළු වියදම වූ රු. 25,134,298,252 න් පුනරාවර්තන කටයුතු සඳහා දරන ලද වියදම රු. 24,166,434,659 ක් හා පළාත් සභා ආයෝජන සඳහා දරන ලද වියදම රු. 967,863,593 ක් වූයෙන් පළාත් සංවර්ධන කටයුතු සඳහා මුළු වියදමෙන් සියයට 4 ක් පමණක් වැය කර තිබුණි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා වලට පැවරී ඇති ආදායම් විෂයයන් 07 කින් ආදායම් රැස්කර නොතිබුණි.

## 4. ප්‍රඥප්ති ගිණුම්

### ඌව නවෝදය අරමුදල

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1992 අංක 01 දරන ඌව නවෝදය අරමුදල් ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද මෙම අරමුදල අක්‍රියව පැවති අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එහි වූ රු. 32,039,853 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. ඊට අමතරව මෙම අරමුදලේ වූ රු. 378,956 ක් ජංගම ගිණුමක නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. | අරමුදල සක්‍රීයව පවත්වා ගනිමින් අපේක්ෂිත අරමුණු ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රඥප්තියේ සඳහන් පොදු පරමාර්ථ ඉටු කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ හා ප්‍රධාන ලේකම් තුමාගේ උපදෙස් පරිදි කටයුතු සම්පාදනය කරමින් පවතී. |

5. මෙහෙයුම් සමාලෝචනය

5.1 කාර්යසාධනය

5.1.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ සඳහා ලැබී තිබුණු ප්‍රදාන සහ ඒවා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අරමුදල් ප්‍රභවය | අනුමත මුදල | වැයකළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| උපමාන පාදක ප්‍රදාන | 559,000,000 | 302,000,000 | 257,000,000 |
| පළාත් විෂය නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 3,418,000,000 | 1,686,500,000 | 1,731,500,000 |
| ලෝක බැංකු ආධාර | 450,000,000 | 250,000,000 | 200,000,000 |
| එකතුව | 4,427,000,000 | 2,238,500,000 | 2,188,500,000 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩ සඳහා රු. 4,427,000,000 ක් අනුමත කර තිබුණු අතර මහා භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම හේතුවෙන් එයින් රු. 2,188,500,000 හෙවත් සියයට 49 ක් ඌන උපයෝජිතව පැවතුනි. | ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කළ යුතුය. | මහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම. |

5.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 3,155 ක ඇස්තමේන්තු අගයකට වූ ව්‍යාපෘති යෝජනා 3,051 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘති වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| ව්‍යාපෘති විස්තර | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා |
|---|---|---|---|
| සම්පූර්ණයෙන් නිමකළ | 2,277 | 306 | 2,583 |
| 50% ට වඩා වැඩියෙන් නිමකළ | 80 | 83 | 163 |
| 50% ට වඩා අඩුවෙන් නිමකළ | 64 | 28 | 92 |
| ආරම්භකර නොතිබූ | 209 | - | 209 |
| මතභේදකාරී/ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | 4 | - | 4 |
| එකතුව | 2,634 | 417 | 3,051 |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට මුළු වැඩ යෝජනා වලින් 163 ක් සියයට 50 ට වඩා වැඩියෙන් ද, 92 ක් සියයට 50 ට වඩා අඩුවෙන් ද, නිමකර තිබුණු අතර ආරම්භ කර නොතිබුණු මුළු වැඩ යෝජනා ගණන 209 ක් වී තිබුණි. පළාත් සංවර්ධන වැඩවල මෙවැනි තත්ත්වයක් ඇතිවීමට මහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය. | ගිවිසුම් වලට එළඹි ව්‍යාපෘති යෝජනා නිමකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම. |
| (ආ) | 2019 වර්ෂයේ උපමාන පාදක සංවර්ධන වැඩසටහන යටතේ මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා ව්‍යාපෘති 701 ක් යෝජනා කර එයින් ව්‍යාපෘති 693 ක් අනුමැතියට යවා තිබුණු අතර ඉන් ව්‍යාපෘති 532 ක් අනුමත කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව 193 ක් වූ බැවින් ව්‍යාපෘති ඉටුකිරීම අනුමත ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 36 ක් වැනි අඩු අගයක් විය. | අනුමත ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. | 2019 වර්ෂයේ ව්‍යාපෘති සඳහා අක්මුදල් ලද ව්‍යාපෘතීන් පමණක් අවසන් කර ඇත. |

### 5.1.3 පාසල් කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහියංගණය අධ්‍යාපන කලාපයේ 2019 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් සමත් ප්‍රතිශතය සියයට 50 ට අඩු පාසල් සංඛ්‍යාව 12 ක්වූ අතර, 2019 වර්ෂය තුළ උසස් පෙළ විභාගය එක් එක් විෂයධාරා වලින් සමත් ප්‍රතිශතය සියයට 50 ට වඩා අඩු වී තිබුණු පාසල් 06 ක් විය. ශිෂ්‍යත්ව විභාගයේ 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විභාග ප්‍රතිඵල කඩඉම් ලකුණු අනුව වර්ෂ 03 දීම විභාගය අසමත් සිසුන් සිටි පාසැල් 15 ක් විය. | විභාග ප්‍රතිඵල වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | ප්‍රතිඵල වර්ධනය කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය අනුව බ/ඌව මහා විද්‍යාලයේ ගුරු භවතුන් 31 දෙනෙකු කාලපරිච්ඡේද 30-35 අතර සංඛ්‍යාවක් ඉගැන්වීමේ නිරත වී නොතිබුණු අතර නියෝජ්‍ය විදුහල්පතිවරු සතියකට අවම කාලපරිච්ඡේද 10 ක් ඉගැන්වීමේ නිරත වී නොතිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 01/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අතිරික්තව සිටි ගුරු භවතුන් ස්ථාන මාරු කර ඉතිරි ගුරුවරුන් සඳහා කාලසටහන් ලබා දී ඇත. නියෝජ්‍ය විදුහල්පතිවරුන්ට අධීක්ෂණ හා පරිපාලන කටයුතු පවරා ඇත. |
| (ඇ) | බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ පාසල් වල අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් සියයට 50 ට වඩා අඩු ප්‍රතිශතයකින් සමත් වූ පාසල් සංඛ්‍යාව 2016 වර්ෂයේදී 18 ක්, 2017 වර්ෂයේදී 18 ක්, 2018 වර්ෂයේදී 12 ක් හා 2019 වර්ෂයේදී 16 ක් විය. | විභාග ප්‍රතිඵල සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විදුහල්පතිවරු කැඳවා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. |
| (ඈ) | 2019 දෙසැම්බර් 04 දින වන විට බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩුවීම හේතුවෙන් වැසීයාමේ අවදානමට ලක්විය හැකි පාසල් සංඛ්‍යාව 26 ක් විය. | අවශ්‍ය පහසුකම් ලබා දීම, ප්‍රතිඵල ඉහළ නැංවීම ආදිය මගින් සිසුන් ආකර්ෂණය කර ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. | වැසීයාමේ අවදානමට ලක්ව ඇති පාසල් ඉන් මුදවා ගැනීම සඳහා සෑම පියවරක්ම ගෙන ඇත. |
| (ඉ) | බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලය විසින් පාසල් අධීක්ෂණ හා ඇගයීම් කටයුතු සඳහා 2018 වර්ෂයේදී රු. 1,657,684 ක් හා 2019 වර්ෂයේදී රු. 1,034,111ක් වැයකර තිබුණි. බාහිර ඇගයීම් සිදුකරන ලද පාසල් වලින් ගුණාත්මක දර්ශකය සියයට 60 ට අඩු පාසල් 2018 වර්ෂයේදී 34 ක් හා 2019 වර්ෂයේදී 40 ක් පැවතුනි. එම පාසල් වල ගුණාත්මක දර්ශක ඉහළ නැංවීම සඳහා යෝජිත සංවර්ධන වැඩසටහන්, පසු විපරම් හා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | පාසල් වල ගුණාත්මක දර්ශක ඉහළ නැංවීම සඳහා වූ සංවර්ධන වැඩසටහන්, පසු විපරම් හා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. | බාහිර අධීක්ෂණයට අදාල පසු විපරම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී පාසල්වල ගුණාත්මක දර්ශක ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. |
| (ඊ) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ක්‍රමසම්පාදන) කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ඌව පළාත් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන ප්‍රවර්ධනය සඳහා 2019 වර්ෂයේ සිට හඳුන්වා දෙන ලද වෙබ් අඩවි 03 කින් අපේක්ෂිත ප්‍රධාන අරමුණු ඉටුකරගෙන නොතිබුණු අතර, 2020 පෙබරවාරි 11 දින වන විට Manpower.lk යන වෙබ් අඩවිය අක්‍රිය තත්ත්වයේ පැවතුනි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | Uvaproduct.lk හි ඌව පළාතේ ව්‍යවසායකයින් 600 කට ආසන්න පිරිසකගේ වෙබ් පිටු සකස්කර ඇත.<br><br>Uvavisit.com වෙබ් අඩවිය නිවාඩු නිකේතන 250 කට ආසන්න ප්‍රමාණයක් ඇතුලත්වී ඇත. සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්ව නොමැති බැවින් අපේක්ෂිත අරමුණු |

| | | | |
|---|---|---|---|
| | | | ලබාකර ගැනීමට නොහැකිවී ඇත. Manpower.lk වෙබ් අඩවිය මේ වන විට සක්‍රීය තත්ත්වයේ පවතී. |
| (ඇ) | ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බිබිල ගොවි පුහුණු මධ්‍යස්ථානය මගින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ-5) මට්ටමේ පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2017 වර්ෂයේදී, ගොවීන්ගේ භාරකාර අරමුදලෙන් ලබාදුන් රු.10,000,000 ක ප්‍රතිපාදන යොදාගනිමින් 2018 සැප්තැම්බර් වන විට සංවර්ධන කටයුතු සිදුකර තිබුණද, 2020 පෙබරවාරි 25 දින වනවිටද අපේක්ෂිත අරමුණ වූ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ-5) මට්ටමේ පාඨමාලා ආරම්භ කර නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2021 ජනවාරි මාසයේ සිට පාඨමාලා කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. |

5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන අමාත්‍ය නිල නිවසේ සූර්ය කෝෂ විදුලි පද්ධතිය සවිකිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය විසින් රු. 6,024,310 ක මුදලක් වැයකර තිබුණි. සූර්ය කෝෂ විදුලි පද්ධතියේ ජනනය කරන අතිරික්ත විදුලිය ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ අන්‍යෝන්‍ය එකඟතාවයක් ඇතිකරගෙන නොතිබුණු අතර ජනනය කරන අතිරික්ත විදුලියෙන් ඌව පළාත් සභාවට ප්‍රතිලාභයක් අත්කරගෙන නොතිබුණි. එමෙන්ම සූර්ය කෝෂ විදුලි පද්ධතිය සවි කිරීමෙන් පසු ජනනය කරන විදුලි ඒකක සංඛ්‍යාව කොන්ත්‍රාක්තරු විසින් ප්‍රකාශිත විදුලි නිෂ්පාදන ධාරිතාවය සමඟ සසඳා නොතිබුණු අතර සූර්ය කෝෂ විදුලි පද්ධතියේ නඩත්තු කටයුතු පිළිබඳ ගිවිසුමකට ද එළඹ නොතිබුණි. | පළාත් සභාවට ප්‍රතිලාභයක් අත්වන අයුරින් විදුලි බල මණ්ඩලය සමඟ එකඟතාවයක් ඇති කර ගත යුතුය. | පළාත් සභාවට ප්‍රතිලාභයක් අත්කර ගැනීමේ අරමුණින් විදුලි බල මණ්ඩල සමඟ එකඟතාවයක් ඇතිකර ගැනීමට කටයුතු කරමින් ඇත. |
| (ආ) | 2016 සැප්තැම්බර් මස 03 දින සිට 12 දින දක්වා සිංගප්පූරුවේදී පැවැත්වීමට නියමිත පුහුණුකරුවන් සඳහා වන සම්මන්ත්‍රණය සහ නෙට්බෝල් තරඟ විශ්ලේෂණය සඳහා සහභාගි වන බව සඳහන් කරමින් නිලධාරිණියන් දෙදෙනෙකු විසින් ශ්‍රී ලංකා නෙට්බෝල් සංගමයේ ලිපි ශීර්ෂයක් භාවිතා කරමින් ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර තිබුණු බව අනාවරණය කරගෙන තිබුණි. එම නිලධාරිණියන් දෙදෙනා 2019 ජුනි 22 දින වන විට තවත් අවස්ථා 03 කදී රටවල් 02 ක විදේශ සංචාර සඳහා සහභාගී කරවා තිබුණු අතර ඒ සඳහා රු. 265,337 ක මුදලක් ද වැයකර තිබුණි. | විමර්ශන කටයුතු කඩිනමින් නිම කර, අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් කරමින් පවතින අතර මෙම සිදුවීමෙන් අනතුරුව එක් නිලධාරිනියක් අවස්ථා දෙකකදී නැවත විදේශ සංචාර සඳහා සහභාගී වී ඇත. එහිදී ඇයට විරුද්ධව පවතින විනය පරීක්ෂණයෙන් වැරදිකරු වුවහොත් හෝ විදේශ නිවාඩු අනුමත නොවුණහොත් ඇයට ගෙවන දීමනා ආපසු අයකර |

| | | | |
|---|---|---|---|
| | | | ගැනීමට කටයුතු කරන බවට ලිඛිතව එකඟ කරගෙන ඊට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන ඇත. |
| (ඇ) | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් බීජ අර්තාපල් ආනයනය කර බෙදාහැරීම සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.10,509,070 ක ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. | ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | රාජ්‍ය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් අදාල ආයතනවල ආයතන ප්‍රධානීන් දැනුවත් කර වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| (ඈ) | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයාගේ අංක 1759/39 දරන ආඥාව ප්‍රකාරව, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ 2012 මැයි 25 දින හෙක්ටයාර් 0.888 ක වපසරියකින් යුතු මොනරාගල ජීලෝන් බංගලාව සහිත ඉඩමේ බුක්තිය ඌව පළාත් සභාව වෙත පවරාගෙන තිබුණද එහි අයිතිය ඉඩම් ඔප්පුවකින් විධිමත් පරිදි පවරාගෙන නොතිබුණි. | ඉඩමේ අයිතිය ඉඩම් ඔප්පුවක් මගින් විධිමත්ව පවරාගත යුතුය. | දිස්ත්‍රික් තක්සේරු කරු විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් සවිස්තර වාර්තාවක් කැඳවා ඇති අතර එය ලද වහාම ඉදිරි කටයුතු සිදු කරමි. |
| (ඊ) | 2017, 2018 හා 2019 වර්ෂ තුලදී ජීලෝන් සංචාරක බංගලාවෙන් උපයන ලද අදායම රු.1,662,600 ක් වූ අතර, එම කාලය තුළ සේවක වැටුප් සඳහා පමණක් රු. 3,204,463 ක වියදමක් දරා තිබුණු බැවින් රු.1,541,863 ක පාඩුවක් සිදු වී තිබුණි. | ආදායම ඉහළ නංවා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | දැනට ප්‍රවේශ මාර්ගයේ පවතින අපහසුතාවයන් නිසා සංචාරක පැමිණීම පහළ මට්ටමක පැවතුනත් ඉදිරියේදී මාර්ගය සංවර්ධනය කිරීම මගින් සංචාරක පැමිණීම ඉහළ ගොස් ආදායම වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. |
| (උ) | බුදුරුවගල වැව ආශ්‍රිතව බෝට්ටු සේවාවක් පවත්වාගෙන යාම සඳහා, ඉදිකිරීම් සිදුකර, බෝට්ටු 06 ක් හා ජීවිතාරක්ෂක කබා 30 ක් මිලදී ගැනීමට, 2018 ඔක්තෝබර් වනවිට රු. 785,882 ක් වැයකර තිබුණද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් සංචාරක බෝට්ටු සේවාව ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් නිම කර සංචාරක බෝට්ටු සේවාව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ සංචාරක අමාත්‍යාංශය මගින් මෙම බෝට්ටු සේවාව ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කළද ප්‍රතිපාදන සීමාවීම |

| | | | |
|---|---|---|---|
| | | | හේතුවෙන් ඉතිරි වැඩ කොටස් ප්‍රාදේශීය සභාව හරහා සිදු කිරීමට නියමිතය. |
| (ඌ) | ඌව පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, පේෂ කාර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය මගින් 2013 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලද උඩවලව සංචාරක විවේකාංගණය සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට රු.39,824,944 ක වියදමක් දරා තිබුණ ද, 2020 ජුලි 29 දින වන විටද විවේකාංගණය හා කඩකාමර සංචාරකයින් සඳහා විවෘත කර නොතිබුණි. | විවේකාංගණය හා කඩකාමර සංචාරකයින් සඳහා කඩිනමින් විවෘත කළ යුතුය. | කඩකාමර 08 ක් බදුදීම සඳහා ගැනුම්කරුවන් ඉදිරිපත් වී ඇති අතර ආපනශාලාව හා මුළුතැන්ගෙය සඳහා ලද මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කෙරේ. |
| (එ) | කිතුල්කොටේ සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ මුළුතැන්ගෙය, ආපනශාලාව හා වැසිකිලි පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් රු. 27,016,820 ක පිරිවැයක් දරා තිබුණද 2020 ජුලි 29 දින වන විටද එම ගොඩනැගිලි නිශ්කාර්යව පැවතුණි. | කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත 2019 දෙසැම්බර් 31 දින මිල ගණන් කැඳවූ අතර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| (ඒ) | හපුතලේ දිසා රෝහල සඳහා ජලය ලබාගන්නා ස්වභාවික ජල උල්පතෙහි ජලයට සත්ත්ව මල එකතුවීම හේතුවෙන් පානය සඳහා නුසුදුසු බව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් තහවුරු කර ඇති බැවින් හා වියළි කාලයේදී එම ජල මූලාශ්‍රය සිඳීයන බැවින් රෝහලට අත්‍යාවශ්‍ය පානීය ජලය සැපයීමේ විකල්ප වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ගැටළුව විසඳීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | පළාත් නිශ්චිත අරමුදල් සඳහා මුදල් නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි විය. |
| (ඔ) | 2018 වර්ෂය තුළ ඌව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරීන් තිදෙනෙකු සහභාගී වූ විදේශ සංචාර 02ක් සඳහා අනියම් හා සංයුක්ත දීමනා වශයෙන් ගෙවා තිබුණු එකතුව රු. 1,051,152 ක් අංක 705-52-7-2-2109(2) දරන යටිතල පහසුකම් සංචාරක සංවර්ධන ප්‍රාග්ධන වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි. | වැය විෂයයන්ට අදාල ගෙවීම් නියමිත වැය විෂයයන් යටතේ ගිණුම්ගත කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ඕ) | පොදු තැන්පතුවල කාල විශ්ලේෂණය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්මවූ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාදනය නොකල ආයතන 26 කට අදාල තැන්පතු ශේෂවල එකතුව රු. 90,233,501 ක් විය. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නියාදන කටයුතු කරන ලෙස ආයතන දැනුවත් කර ඇති අතර ඒ අනුව ඉදිරියේදී කටයුතු කිරීමට නියමිතය. |

| | | | |
|---|---|---|---|
| (ක) | ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 52 කින් ස්ථාන මාරුවී ගිය, මියගිය හා විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 44,712,331 ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය, ඌව පළාත් මුදල් රීති 485(4) හා ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ 2004 ජනවාරි 08 දිනැති අංක 2004/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ණය ශේෂ පියවීමට හා නිරවුල් කිරීමට කටයුතු කෙරේ. |
| (ග) | ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු විවිධ ආයතන 13 කින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ රු. 17,033,713 ක් වූ ණය ශේෂ නිරවුල් කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය, ඌව පළාත් මුදල් රීති 485(4) හා ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ 2004 ජනවාරි 08 දිනැති අංක 2004/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ණය ශේෂ පියවීමට හා නිරවුල් කිරීමට කටයුතු කෙරේ. |
| (ච) | වර්ෂ 10 කට අධික කාලයක සිට පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් දක්වා තිබුණු රු. 40,319,651ක අයවිය යුතු ණය මුදල අදාල නිලධාරීන්ගෙන් අයකර නොතිබුණි. | ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | විවිධ කාල වල වූ දේශපාලන මැදිහත්වීම මත ගොවීන්ගෙන් අයකරගත යුතු ශේෂ අයකර ගැනීම අවම වී ඇත.<br><br>වසර 10 කට අධික කාලයක් ගතවී ඇති බැවින් නෙදර්ලන්ත ආයතනයේ ණය අයකර ගැනීමට නොහැකි බව නීතිපති විසින් දන්වා ඇත.<br><br>උපලේඛන නොමැති බැවින් දිරිදීමනා ශේෂය අයකරගත නොහැක. |
| (ජ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4, 2.5 සහ 2.6 ඡේද ප්‍රකාරව මොනරාගල ප්‍රාදේශීය ඉංජිනේරු (මාර්ග) කාර්යාලය විසින් 2018 සහ 2019 වර්ෂ වලට පත් කර තිබුණු ප්‍රසම්පාදන සහ තාක්ෂණික ඇගයීම් කමිටු වල සාමාජිකයින්ට වගකීම් සහ කාර්යභාරයන් පවරා නොතිබුණි. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ට) | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝකාලීන බදුකර මත ලබාදී තිබුණු ඉඩම් 5 ක් වෙනුවෙන් 2019 දෙසැම්බර් | හිඟ බදු මුදල් අයකර ගැනීමට | පළාත් ඉඩම් කොමසාරිස් හා |

| | | | |
|---|---|---|---|
| | 31 දිනට අයවිය යුතු රු. 24,690,528 ක හිඟ බදු මුදල් අයකරගෙන නොතිබුණි. | කටයුතු කළ යුතුය. | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |

5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>----------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම<br>--------------------- |
|---|---|---|---|
| (අ) | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනෙකු 2018 වර්ෂය තුලදී කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත් වූ දින 33 කින් දින 10-17 අතර වාර ගණනකට සහභාගි වී නොතිබුණු අතර 2019 ජනවාරි 01 දින සිට ජුලි 30 දින දක්වා පැවැත් වූ රැස්වීම් වාර 24 කින් වාර 9-10 අතර වාර ගණනකට සහභාගි වී නොතිබුණි. එහෙත් එම කාලය සඳහා එම සාමාජිකයන් තිදෙනාට දීමනා වශයෙන් රු. 1,368,000 ක් ගෙවා තිබුණි. | රැස්වීම් සඳහා සක්‍රිය දායකත්වය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පැමිණීම හෝ කාර්යයන් සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන ඇතුලත් නොවේ. සාමාජිකයින් නොපැමිණියද ඔවුන්ට හිමි මාසික දීමනාව පනතේ 33(5) වගන්තිය ප්‍රකාරව ගෙවනු ලැබේ. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට වැල්ලවාය මූලික රෝහලේ තිබූ වටිනාකම රු. 697,172 ක් වූ ඖෂධ වර්ග 97 ක ඒකක 13,553 ක් කල් ඉකුත් වී තිබුණි. | ක්‍රමවත් තොග පාලන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. | කල් ඉකුත් වූ ඖෂධ සියල්ල 2019 දෙසැම්බර් 29 වන දින අපහරණය කර ඇත. |
| (ඇ) | ළඟම පාසල හොඳම පාසල 'බී' ව්‍යාපෘතිය යටතේ රු. 24,225,403 ක ප්‍රතිපාදන මත මො/බෝදාගම මහා විද්‍යාලයේ විද්‍යා, ගණිත, ඊ පුස්තකාල, තොරතුරු තාක්ෂණ පහසුකම් සහිත කණිෂ්ඨ ද්විතියික විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පාසල් භූමියේ පැවති ගස් 08 ක් 2016 අගෝස්තු මස කපා ඉවත් කරගෙන තිබුණද එම ඉදිකිරීම් 2019 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිකිරීම් ආරම්භකර නොමැති කර්මාන්ත අවලංගු කිරීමට ගත් තීරණයක් මත 2017 මාර්තු 17 දින කර්මාන්තය අවලංගු කර ඇත. |
| (ඈ) | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම් කච්චේරි මගින් හඳුනාගෙන දීර්ඝකාලීන බදුකර 8 ක් ලබාදීමට නිර්දේශ ලබාදී 2019 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 5 සිට වර්ෂ 24 ක කාලයක් ගතවී තිබුණද ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන බදු දීමට කටයුතු කර නොතිබුණි. | බදුකර ලබාදී අදාල බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදාල ඉඩම් සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ ලද වහාම ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. |

5.4 වත්කම් කළමනාකරණය

5.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඔක්කම්පිටිය බීජ නිෂ්පාදන ගොවිපලට අයත් ට්‍රැක්ටර් 02 ක් සහ සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍රය වසර 10 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | 2021 වර්ෂයේ වෙන්දේසි කටයුතු කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වැලිමඩ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල භූමියෙහි, 2010 වර්ෂයේදී රු.280,000 ක් වැයකර ඉදිකරන ලද මීටර් 8 x 20 ප්‍රමාණයේ ආරක්ෂිත වගා ගෘහ දෙකක් 2014 වර්ෂයෙන් පසුව ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | අලුත්වැඩියා කළ යුතුව ඇති හරිතාගාර දෙක අලුත්වැඩියා කර හරිතාගාර බෝග වගා කර ඒ මගින් ගොවි පුහුණු කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත. |

5.4.2 හඳුනා ගන්නා ලද පාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් 2018 මැයි 08 දින අනතුරට ලක්වීමෙන් සිදු වූ රු. 237,912 ක අලාභ හානිය සම්බන්ධයෙන් වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පළාත් සභා මුදල් රීති 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පළාත් සභා මුදල් රීති 104 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අලාභයෙන් කොටසක් රක්ෂණාවරණයෙන් ලබාගෙන ඇත. ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කර ඇත. |
| (ආ) | ඔක්කම්පිටිය බීජ ගොවිපලෙහි අනියම් පදනම මත සේවයේ යොදවා ගන්නා ලද සේවකයින් වෙනුවෙන් 2010 අප්‍රේල් 01 සිට 2013 මැයි 31 දක්වා කාලයට අදාලව සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් නොගෙවීම හේතුවෙන් 2018 වර්ෂයේදී රු.376,374 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි. | සිදුවී ඇති පාඩුව ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අංක 7/2/2/7-2 හා 2018 මැයි 30 දිනැති ලිපියෙන් කළ දැනුම් දීමට අනුව මෙම මුදල ගොවිපල අත්තිකාරම් ගිණුමෙන් ගෙවා ඇත. |

5.4.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) රාවණාඇල්ල නැරඹුම් වේදිකාව ඉදිකිරීම** | | |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ 2015 ජුලි මස 23 දිනැති පස් පරීක්ෂණ වාර්තාව අනුව රාවණාඇල්ල නැරඹුම් ස්ථානය ඉදිකිරීමට යෝජිතව පැවති ස්ථානයේ අත්තිවාරම් යෙදීමට පෙර පාෂාණ බැවුම් ස්ථායිතා විශ්ලේෂණයක් සිදුකළ යුතුව තිබුණි. ඒ පිළිබඳ නොසලකා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2015 නොවැම්බර් 11 දින ඉදිකිරීම් කටයුතු සඳහා රු. 6,460,382 ක ගිවිසුමකට එළඹ තිබුණි. ඉදිකිරීම් භූමියේ යෝග්‍යතාවය පිළිබඳව උද්ගත වූ ගැටළු හේතුවෙන් 2016 සැප්තැම්බර් 14 දින ගිවිසුම අන්‍යොන්‍ය එකඟතාවයෙන් අවලංගු කර තිබුණු අතර ඒ දක්වා කොන්ත්‍රාත්තුව වෙනුවෙන් වැයකළ රු. 967,042 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. අදාල ඉදිකිරීම සඳහා නැවත 2018 නොවැම්බර් 22 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් රු. 9,765,004 ක ගිවිසුමකට එළඹ 2019 සැප්තැම්බර් 04 දින කර්මාන්තයේ වැඩ අවසන් කර තිබුණි. | පළාත් සභා අරමුදලට සිදු වූ පාඩුව සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන අවශ්‍ය කටයුතු කළ යුතුය. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් ලබාගත් නිර්දේශ අනුව අස්ථාවර භූමියක් වූ බැවින් අදාල පාර්ශව සමඟ සාකච්ඡා කර මුල් කර්මාන්තය අත්හිටුවා පසුව වැඩ අවසන් කර ඇත. |
| **(ආ) හාලිඇල පරිගණක සම්පත් පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම** | | |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2016 ජුනි 27 දින **කොන්ත්‍රාත් සමාගමක්** සමඟ රු. 68,848,145 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ 2016 අගෝස්තු 29 දින අත්තිකාරම් වශයෙන් රු. 13,760,000 ක් ගෙවා තිබුණි. 2017 ජුනි 21 දින කර්මාන්තයේ වැඩ අවසන් කළයුතු වුවද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. ගිවිසුම ප්‍රකාරව අයකල යුතු ප්‍රමාද ගාස්තුව රු. 3,422,407 ක් වුවද, **2018** අප්‍රේල් 24 දින වන විට රු. 1,721,204 ක් පමණක් අයකර ගෙන තිබුණි.<br><br>2019 අප්‍රේල් 09 දින කොන්ත්‍රාත්කරු සමඟ වූ ගිවිසුම අවලංගු කර තිබුණු අතර පළාත් සභා මුදල් රීති 705 ප්‍රකාරව කොන්ත්‍රාත්කරු අසාධුගත කර නොතිබුණි. අත්තිකාරම් මුදලින් රු. 1,740,000 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර අත්තිකාරම් ඇපකරයේ වලංගු කාලය 2018 සැප්තැම්බර් 21 දින අවසන් වී තිබීම නිසා අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන් පියවා ගැනීමට හෝ ඇපකරයේ වලංගු කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු නොකිරීමෙන් රු. 12,020,000 ක පාඩුවක් සිදු වී තිබුණි.<br><br>කාර්යසාධන ඇපකරයේ වලංගු කාලය 2019 ජුලි 31 දින අවසන් වී තිබුණු අතර කොන්ත්‍රාත්කරු අපේක්ෂිත කාර්යසාධන මට්ටමට ලඟා නොවීම හේතුවෙන් ඇපකරය මගින් අයකර ගත හැකිව තිබුණු රු. 3,443,000 ක මුදලද අයකර ගත නොහැකිව තිබුණි. | අදාල මුදල් අයකර ගැනීමටත්, කර්මාන්තය කඩිනමින් නිම කරගැනීමටත් කටයුතු කළ යුතුය. කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ මු.රී.705 ප්‍රකාරව කටයුතු කර පළාත් සභාවට සිදුවී ඇති පාඩුව ආවරණය කරගත යුතුය. | අත්තිකාරම් ඇපකරය හා කාර්ය සංසිද්ධි ඇපකරය අය කර ගැනීම සඳහා නීතිමය කටයුතු කරමින් පවතී.<br><br>කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල් රඳවාගෙන ඇත. |

(ඇ) ලුණුගල ආයුර්වේද රෝහලේ මුළුතැන්ගෙය හා ඖෂධ නිෂ්පාදනාගාරය ඉදිකිරීම

------------------------------------------------------------

| | | |
|---|---|---|
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2018 සැප්තැම්බර් 25 දින කොන්ත්‍රාත්කරුවකු සමඟ රු. 3,024,605 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණු අතර 2019 මාර්තු 18 දින වන විට අත්තිකාරම සමඟ රු. 1,107,000 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්තුව නියමිත දිනට අවසන් නොකිරීම හේතුවෙන් 2019 නොවැම්බර් 29 දින ගිවිසුම අවලංගු කර තිබුණු අතර ගිවිසුම ප්‍රකාරව අයකර ගත යුතු ප්‍රමාද ගාස්තු රු. 151,230 ක් අයකරගෙන නොතිබුණි.<br><br>අත්තිකාරම් ඇපකරයේ වලංගු කාලය 2019 ජුනි 20 දිනෙන් අවසන් වී තිබූ අතර රු. 907,000 ක අත්තිකාරම් මුදලද අයකරගෙන නොතිබුණි. කාර්යසාධන ඇපකරයේ වලංගු කාලය 2019 සැප්තැම්බර් 24 දිනෙන් අවසන්ව තිබූ අතර රු. 151,300 ක් වූ කාර්යසාධන ඇපකරයේ වටිනාකමද අයකරගෙන නොතිබුණි. | අදාල ඇපකර මුදල් කර ගැනීමත්, කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ මු.රී.705 ප්‍රකාරව කටයුතු කිරීමත් කළ යුතුය. | කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලින් රු. 359,790 ක් රඳවාගෙන ඇති අතර ඉතිරිය කොන්ත්‍රාත්කරුට අයත් වෙනත් කර්මාන්ත සඳහා ගෙවිය යුතු මුදල් වලින් අයකර ගැනීමෙන් අත්තිකාරම් මුදල පියවා ගැනීමට අපේක්ෂා කරමි. |

(ඇ) බිබිල මූලික රෝහලේ පරිපාලන ගොඩනැගිල්ල නවීකරණය කිරීම

------------------------------------------------------------

| | | |
|---|---|---|
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ 2017 දෙසැම්බර් 12 දින රු. 50,212,829 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණි. කර්මාන්තය ඉටු කිරීම සඳහා තෝරා ගන්නා කොන්ත්‍රාත්කරු පසුගිය වර්ෂ 05 ක කාල පරිච්ඡේදය තුලදී රුපියල් මිලියන 35 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීමක් සාර්ථකව නිමකර තිබීම ඇගයීම් නිර්නායකයක් ලෙස දක්වා තිබුණද තෝරාගෙන තිබුණු කොන්ත්‍රාත්කරු මෙම නිර්නායකය සපුරා නොතිබුණි. සුදුසුකම් සපුරා නොමැති කොන්ත්‍රාත්කරුවෙකුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නා ලෙස ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මහ ලේකම්වරයා 2019 පෙබරවාරි 20 දිනැති ලිපිය මගින් ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා වෙත දන්වා තිබුණද 2019 දෙසැම්බර් 24 දින වන විටත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මහ ලේකම්වරයාගේ අංක NPC/ASG-02/DPI/2017/C-46 දරන 2019 පෙබරවාරි 20 දිනැති ලිපියේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් කමිටුවක් පත්කර කටයුතු කරමින් පවතින අතර පරීක්ෂණ කටයුතු නිමකර එහි ප්‍රගතිය ඉදිරියේදී වාර්තා කරමි. |

(ඉ) බිබිල ගොවි පුහුණු මධ්‍යස්ථාන භූමියේ නිල නිවසක් ඉදිකිරීම

------------------------------------------------------------

| | | |
|---|---|---|
| පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බිබිල ගොවි පුහුණු මධ්‍යස්ථාන භූමියෙහි කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා නිල නිවසක් ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු.5,848,901 ක මුදලකට ගිවිසුම් ගතවී 2018 දෙසැම්බර් 14 දින වැඩ ආරම්භ කර, 2019 පෙබරවාරි 10 දින වැඩ අවසන් කළ යුතුව තිබුණි. එහෙත් 2020 පෙබරවාරි 25 දින වනවිට එහි කොටසක් නිමකර, ඉදිකිරීම් වැඩ නතර කර තිබුණු අතර 2019 අගෝස්තු 07 දින වනවිට මෙම කර්මාන්තය වෙනුවෙන් රු.2,725,948 ක මුදලක් ගෙවා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ අඛණ්ඩ කර්මාන්මාන්තයක් ලෙස පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැඩසටහනට ඇතුළත් කොට මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇත. |

(ඊ) දියතලාව හෙල බොජුන් හලෙහි විවේකාගාරය හා වැසිකිළි පද්ධතිය ඉදිකිරීම

| | | |
|---|---|---|
| පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දියතලාව හෙල බොජුන් හලෙහි විවේකාගාරය හා වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.1,296,012 ක මුදලක් පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණද 2020 පෙබරවාරි 25 දින වන විටද එහි ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. | විවේකාගාරය හා වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කළ යුතුය. | රජයේ ආදායමට බැරකර ඇති මුදල වන රු. 1,190,338 ක් නැවත පවරා දෙන මෙන් පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. එම මුදල් ලද පසු වෙනත් ලංසුකරුවෙකු මගින් අදාල කටයුතු ඉටු කරවා ගැනීමට අපේක්ෂා කෙරේ. |

5.5 කාර්ය මණ්ඩල පරිපාලනය

5.5.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2019 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා කාර්යාල (පාසල් කාර්ය මණ්ඩලය හැර)

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | **1447** | 996 | 451 | - |
| (ii) | තෘතියික මට්ටම | **310** | 196 | 114 | - |
| (iii) | ද්විතියික මට්ටම | **7846** | 6510 | 1336 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 5865 | 5177 | 688 | - |
| (v) | වෙනත් | | | | |
| | - අනියම් | - | 522 | - | 522 |
| | - කොන්ත්‍රාත් | - | 278 | - | 278 |
| | එකතුව | 15468 | 13679 | 2589 | 800 |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | විදුහල්පතිවරුන් | 1077 | 678 | 399 | - |
| (ii) | ගුරුභවතුන් | 16384 | 17467 | - | 1083 |
| (iii) | සහය කාර්ය මණ්ඩලය | 2464 | 2822 | - | 358 |
| (v) | වෙනත් | | | | |
| | - අනියම් | - | 14 | - | 14 |
| | - කොන්ත්‍රාත් | - | 14 | - | 14 |
| | එකතුව | 19925 | 20995 | 399 | 1469 |

5.5.2 පළාත් සහා අනෙකුත් කාර්ය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2019 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව විශ්‍රාමික නිලධාරීන් 07 දෙනෙකු දීප ව්‍යාප්ත හා සමාන්තර සේවාවල තනතුරු සඳහා පත්කර තිබුණු අතර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකළ කෘෂි විද්‍යාඥ තනතුරක් සඳහා විශ්‍රාමික නිලධාරියෙකු පත්කර තිබුණි. | 2019 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2019 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2019 අනුව නිලධාරීන් පත් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත නිර්දේශ යොමු කර ඇත. |

5.5.3 අධ්‍යාපන සම්බන්ධ කාර්ය මණ්ඩල පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහියංගණය අධ්‍යාපන කලාපයේ එකම සේවා ස්ථානයේ වසර 10 කට වඩා වැඩි කාලයක් සේවය කරමින් සිටින ගුරුභවතුන් 249 ක් වූ අතර ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් නොවන ගුරු උපදේශක තනතුරු සඳහා ගුරුභවතුන් 27 දෙනෙකු කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත කර සේවයේ යොදවා ගෙන තිබුණි. ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විදුහල්පති තනතුරු සඳහා ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ වලින් පසු තෝරාගත් පිරිසක් බඳවා ගතයුතු වුවද, වැඩබැලීමේ පදනමින් පත්කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ 1-2(I), 2(II) හා 3(I) ශ්‍රේණිවල නිලධාරීන් පිළිවෙළින් 13,10, 07 හා 04 දෙනෙකු බැගින් විය. | ගුරු මාරු ප්‍රතිපත්තිය, ගුරු සේවා ව්‍යවස්ථාව හා ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වසර 10 කට වඩා වැඩි කාලයක් සේවය කරමින් සිටි ගුරුභවතුන් 89 ක් සඳහා ස්ථාන මාරුවීම් ලබාදී ඇත. පාසලේ සේවය කරන විදුහල්පති විශ්‍රාම යාමේදී ඔහු විසින් හඳුනාගත් ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක් වෙත |

| | | | |
|---|---|---|---|
| | | | ලොග් සටහනක් මගින් රාජකාරි පවරා ඇත. |
| (ආ) | මහියංගණය අධ්‍යාපන කලාපයේ පාසල් වලට පත්වීම් ලද ගුරුභවතුන් 24 දෙනෙකු වැටුප් ලබන පාසලේ සේවා අවශ්‍යතාව හදුනා නොගෙන විකල්ප අනුප්‍රාප්තිකයන් රහිතව කලාපය තුල හා කලාපයෙන් පිටත පළාත් සභා හා ජාතික පාසල් වලට අනුයුක්ත කර තිබුණි. | වැටුප් ලබන පාසලේ සේවා අවශ්‍යතාවය හා පත්වීම් කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. | තවදුරටත් අනුයුක්තව සිටින ගුරුභවතුන් ගණන 08 කි. |
| (ඇ) | බ/ඌව මහා විද්‍යාලයේ 2019 නොවැම්බර් 18 දිනට ගුරු ඌනතාවය 07 ක් හා ගුරු අතිරික්තතාවය 15 ක් වූ අතර, පාසල් වැටුප් ලේඛනයෙන් වැටුප් ලබන ගුරු භවතුන් 07 දෙනෙකු ජාතික පාසල්, පළාත් සභා පාසල් හා කාර්යාල වලට අනුයුක්ත කර තිබුණි. | පත්වීම් කොන්දේසි, ගුරු මාරු ප්‍රතිපත්තිය, ගුරු තුලනය හා පාසලේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කල යුතුය. | ගුරු ඌනතාවය 03 ක්, ගුරු අතිරික්තතාවය 06 ක් හා පාසල් වැටුප් ලේඛනයෙන් වැටුප් ලබන ජාතික පාසල් වලට, පළාත් සභා පාසල් වලට හා කාර්යාල වලට අනුයුක්ත කර ඇති ගුරු භවතුන් 06 ක් බවට පත්ව ඇත. |
| (ඈ) | 2019 ජුනි 30 දිනට වැලිමඩ අධ්‍යාපන කලාපයේ පාසල් 95 ක ගුරු ඌනතාවය 375 ක් වූ අතර අතිරික්තතාවය 22 ක් විය. ඉන් පාසල් 39 ක ගුරු ඌනතාවය 5-21 දක්වා පැවතුනි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගනිමින් ගුරු තුලනයක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ගුරු තුලනය සිදු කරමින් පාසල්වල ගුරු ඌනතාවය සමනය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඉ) | වැලිමඩ අධ්‍යාපන කලාපයේ පාසල් වලින් වැටුප් ලබන ගුරු භවතුන් දෙදෙනෙකු වෙනත් අධ්‍යාපන කලාප වල පාසල් වලට අනුයුක්ත කර තිබුණු අතර වෙනත් අධ්‍යාපන කලාප වල පාසල් වලින් වැටුප් ලබන ගුරු භවතුන් 16 දෙනෙකු වැලිමඩ අධ්‍යාපන කලාපයේ පාසල් වලට අනුයුක්ත කර තිබුණි. මෙම අනුයුක්ත කිරීම් විකල්ප අනුප්‍රාප්තිකයන් රහිතව සහ පාසල් වල සේවා අවශ්‍යතාවය හදුනා නොගෙන සිදුකර තිබුණි. | වැටුප් ලබන පාසලේ සේවා අවශ්‍යතාවය හා පත්වීම් කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. | වෙනත් අධ්‍යාපන කලාප වල පාසල් වලින් වැටුප් ලබන ගුරු භවතුන්ගෙන් 12 දෙනෙකු මේ වන විට වැලිමඩ කලාපයේ පාසල් වල සේවය නොකරන අතර 4 දෙනෙකු වැලිමඩ කලාපයට ස්ථාන මාරුවීම් ලබා ඇත. |
| (ඊ) | බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ පාසැල් 73 ක වසර 10 කට වඩා වැඩි කාලයක් එකම පාසැලේ සේවය කරන ගුරු භවතුන් සංඛ්‍යාව 326 ක් විය. | ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව කටයුතු කළ යුතුය. | ගුරු භවතුන් 64 දෙනෙකු වයස අවුරුදු 57 ඉක්ම වූවන් වන අතර 110 දෙනෙකු වයස අවුරුදු 55 ඉක්ම වූවන් වෙති. |

27 දෙනෙකු පත්වීම් කොන්දේසි අනුව අවම වසර 10 ක් පත්වීම් ලද පාසලේම සේවය කළ යුතු වූවන් වෙති.
අනෙකුත් ගුරු භවතුන් ක්‍රමානුකූලව ස්ථාන මාරු කරමින් පවතී.

5.6 පළාත් පාලන ආයතන අධීක්ෂණය
-----------------------------------------

5.6.1 හිඟ ආදායම්
-------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතන වලට ලැබිය යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් රු. 954,781,842 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් අදාල පාර්ශව දැනුවත් කර ඇත. |
| (ආ) | මහා නගර සභා හා නගර සභා (සංශෝධිත) පනත් සහ 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 129(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු උසාවි දඩ රු. 114,982,672 ක් හා මුද්දර ගාස්තු රු. 242,218,261 ක් විය. | පාලන ආයතන වලට අය විය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු එම ආයතන වලට ලබා දීමට කටයුතු කළ යුතුය. | පළාත් පාලන ආයතන විසින් ඉල්ලීම් කිරීමෙන් පසු පළාත් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලද, සියළුම මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් නොපමාව එම ආයතන වෙත ලබා දී ඇත. |

5.6.2 නිකුත් කර තිබුණු අධිභාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්
-----------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල ධූරධාරීන්ට හා නිලධාරීන්ට එරෙහිව පනවා තිබුණු අධිභාර වෙනුවෙන් රු. 5,877,851 ක් අය විය යුතුව තිබුණි. | පනවා ඇති අධිභාර අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | අධිභාර අය කර ගැනීම සම්බන්ධයෙන් අදාල පාර්ශව දැනුවත් කර ඇත. |

5.7 වාර්ෂික වාර්තා සභාගත කිරීම
---------------------------------

පසුගිය වර්ෂ 05 ක ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාවේ සභාගත කිරීම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කළ දිනය | වාර්තාව සභාගත කළ දිනය |
|---|---|---|
| 2014 | 2015.09.21 | 2016.07.14 |
| 2015 | 2016.12.06 | 2017.02.20 |
| 2016 | 2017.08.21 | 2017.09.28 |
| 2017 | 2018.09.28 | 2018.10.25 |
| 2018 | 2019.05.29 | 2019.06.13 |

5.8 **නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ**
-----------------------------------------------

පහත සඳහන් විගණන ඡේද සම්බන්ධයෙන් 2017 මාර්තු 23 දින පැවැති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය ප්‍රකාරව උපලේඛනගත නිවාස හිමි නිලධාරීන්ගේ මාසික වැටුපෙන් සියයට 10 ක් නිවාස කුලී ලෙස අයකළ යුතු වුවද එයට අනුකූල නොවන ලෙසට 2008 අගෝස්තු 01 දින සිට ඌව පළාත් සභාවේ ලේකම්වරුන්ගෙන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගෙන් මසකට රු. 500 ක නාමික නිවාස කුලියක් අයකරමින් පැවතුණි. | 2017 මාර්තු 23 දින පැවැති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | පළාත් අරමුදල් පිළිබඳ ගිණුම් කාරක සභා නිර්දේශ අනුව මසක් ඇතුලත පොදු ප්‍රතිපත්තියක් සකස් කර දෙන ලෙස අංක 5/AC/FA/GA/2019/09 හා 2019 මැයි 30 දිනැති ලිපියෙන් ප්‍රධාන ලේකම් වෙත දන්වා ඇත. |
| (ආ) | බණ්ඩාරවෙල දිසා රෝහලට අයත් ඉඩම තුළ පර්චස් 2.66 ක ප්‍රමාණයක අනවසරයෙන් නිවාස ඉදිකර ඇති බවට මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2013 නොවැම්බර් 25 දින වාර්තාවක් ලබාදී තිබුණු අතර වැලිමඩ මූලික රෝහල පිහිටි නියදගල පතන ඉඩමෙන් අක්කර 01 පර්චස් 0.8 ක ප්‍රමාණයක අනවසර පදිංචිකරුවන් පදිංචි වී ස්ථිර ගොඩනැගිලි ඉදිකර ඇති බව අනාවරණය වී තිබුණි. අදාල රෝහල් වලට අයත් ඉඩම් වල මායිම් නිරවුල් කිරීම් සඳහා නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර අනවසර පදිංචිකරුවන් ඉඩම් වලින් ඉවත් කර 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ කටයුතු කර නිරවුල් භුක්තිය ලබාගැනීමට පියවරගෙන නොතිබුණි. | 2017 මාර්තු 23 දින පැවැති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | බණ්ඩාරවෙල දිසා රෝහලට අයත් හෙක්ටයාර 5.0863 සතු ඉඩමේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොටසේ මායිම් මේ වන විට පෙන්වාදී අවසන් කර ඇත. හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොටසේ මායිම් නිරවුල් කර ගැනීම සඳහා 2018-24 දරන මැනුම් ඉල්ලීම |

| | | | |
|---|---|---|---|
| | | | යොමු කර ඇත. වැලිමඩ මූලික රෝහලේ ඉඩම සම්බන්ධයෙන් 2019 ජුනි 18 දින අදාල පාර්ශවයන් සමඟ පැවති රැස්වීමේදී ගනු ලැබූ තීරණ අනුව අදාල කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී. |
| (ඇ) | වැලිමඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අලකොලගාල ග්‍රාම නිලධාරී වසමේ මීපිලිමාන පිහිටි හෙක්ටයාර 11.056 කින් යුත් බිම් කොටස වාණිජ කටයුත්තක් සඳහා වසර 30 ක කාලයකට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට බදුදීමට 2011 මැයි 09 දින ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කර තිබුණි. මෙම ඉඩම බදු දීම සම්බන්ධයෙන් බදු ගිවිසුමකට එළඹීමට හෝ බදු ඔප්පුවක් පිළියෙල කිරීමට ද කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් මෙම ඉඩමෙන් අක්කර 19 ක භූමි ප්‍රමාණයක් වසරකට රු.2,755,000 ක බදු කුලියකට 2012 නොවැම්බර් 06 දින සිට වගා කටයුතු සඳහා පෞද්ගලික පාර්ශවයකට බදු දී තිබූ අතර දිස්ත්‍රික් තක්සේරුකරුගේ 2012 ජුනි 14 දිනැති තක්සේරු වාර්තාව අනුව 2012 සිට 2016 වර්ෂය දක්වා ගුවන් විදුලි සංස්ථාවෙන් ඌව පළාත් සභාවට අයවිය යුතු රු.8,680,000 ක් වූ බදු ආදායමක් අයකර ගෙන නොතිබුණි. | 2017 මාර්තු 23 දින පැවැති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | මෙම බිම් කොටස සම්බන්ධයෙන් බදුකරයක් සකස් වී නොමැති අතර වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමකින් තොරව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සම්පූර්ණ අභිමතය මත මෙය සිදුවී ඇත.<br><br>රජයේ යම් සේවාවක් හෝ අධිකාරී අවසර පත්‍රයක් පිළියෙල කිරීමේදී ඊට නියමිත අය කිරීම් මුදල් රෙගුලාසි වලට අනුව සිදු විය යුතු වුවත් එය මෙම ක්‍රියාවලියේදී සම්පූර්ණ වී නොමැති බැවින් මෙම මුදල අයකර ගැනීම ප්‍රායෝගික නොවේ.<br><br>ගුවන් විදුලි සංස්ථාව විසින් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කරමින් සිදු කර ඇති කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හෝ ඌව පළාත් ඉඩම් |

| | | | |
|---|---|---|---|
| | | | කොමසාරිස් පොර්තමේන්තුවට ඉදිරි කටයුතු සිදුකිරීමට ප්‍රායෝගිකව අවස්ථාවක් නොමැත. |

5.9 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් 2018 සැප්තැම්බර් 20 දින වැල්ලවාය මූලික රෝහලට ලබාදී තිබුණු රු. 6,000,000 ක ජංගම ඉන්සිනරේටර් යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන, රෝහලෙන් ඉවත් කරන තියුණු සහ ආසාදිත අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කර තිබුණි. | අවිධිමත්ව අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවට ඉන්සිනරේටර් යන්ත්‍රය ප්‍රයෝජනයට ගත යුතුය. | ඉන්සිනරේටරය ස්ථාපනය කිරීමේ පළමු අදියරේ වැඩ මේ වන විට අවසන් කර ඇත. ඉන්සිනරේටරයෙහි ආරක්ෂිත ආවරණය ඉදිකිරීම සඳහා දෙවන අදියරට අදාල කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. එහි වැඩ නිමවූ වහාම යන්ත්‍රය භාවිතයට ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වැල්ලවාය මූලික රෝහලේ භාවිතා වන මල අපවහන පද්ධතිය ප්‍රමාණවත් නොවන බැවින් වර්ෂා කාලවලදී නිතර මල අපද්‍රව්‍ය උතුරා යාමට ලක්වෙමින් පැවතුණි. | ප්‍රමාණවත් මල අපවහන පද්ධතියක් ස්ථාපනය කිරීමට කටයුතු කළ යුතුය. | අඩු වියදම් සංකල්පයක් ඇතුලත් යෝජනා ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කර ඇති අතර අදාල ප්‍රතිපාදන යටතේ මේ සඳහා විසඳුමක් සකස් කිරීමට අපේක්ෂා කරමි. |
| (ඇ) | තණමල්විල ප්‍රාදේශීය රෝහලේ වාට්ටුවලින් සහ රසායනාගාරය හැර අනෙකුත් අංශවලින් බැහැර කරන අපද්‍රව්‍ය මිශ්‍ර ජලය ප්‍රතිචක්‍රීයකරණය නොකර මොනරාගල මාතර ප්‍රධාන මාර්ගයේ කාණු පද්ධතියට බැහැර කරමින් පැවතුණි. | අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. | අඩු වියදම් සංකල්පයක් යෝජනා කරන අතර ඉදිරියේදී එය ක්‍රියාත්මක කර විසඳුමක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |